පොත් ටික විකිණුනා. ඒ නිසා තමයි මට තව පොත් ගහන්න ඉඩක් ලැබුණේ. දයාවංශ ජයකොඩි සමාගම නමින් මුලින්ම කළ 'ගිනිදැල්' කියන පොතටත් හොඳ ඉල්ලුමක් තිබිලා ඒ පොතත් හොඳට අලෙවි වුණා. ඒ මුල්පොත් විකුණුනේ නැත්නම් අපේ ආර්ථිකය කඩා වැටිලා මේක කරගන්න බැරි තත්ත්වයක් ඇතිවෙනවා. පොත්වල හොඳකමට හරි, පෙර පිනක් තිබිලා හරි ඒ මුල් පොත් හුඟාක් සාර්ථක වුණා. ඒ නිසා පී.එම්. ජයතිලක මහතාත්, නිමල් ආරියවංශ පෙරේරා මගේ කල්‍යාන මිත්‍රයාත් මුලින්ම දීපු සහයෝගය වගේම පසුව ජයකොඩි සෙනෙවිරත්න, නිව්ටන් ගුණසේකර, එඩ්වඩ් මල්ලවාරච්චි වගේ ලේඛකයන්ගෙන් ලැබුණ සහයෝගය මම ඉතාම ගෞරවයෙන් සිහිපත් කරනවා.

**ඔබ පොත් ප්‍රකාශනයට පිවිසුන අවධියේ වගේ නොවෙයි අද පොතක් මුද්‍රණය කිරීම තාක්ෂණික පැත්තෙන් බොහොම පහසු දෙයක්. නමුත් අනෙක් පැත්තෙන් පොතක් මුද්‍රණය කිරීම සඳහා යන වියදම් ආදිය පැත්තෙන් ගත්තම මේක බොහොම අපහසු කාර්යයක් බවකුත් පේනවා. එදා මේ ප්‍රශ්ණ ඔබට බලපෑවේ කොහොමද?**

මට ඒ කාලෙත් ඒවා ඒතරම් ප්‍රශ්ණ වුණේ නෑ. අදටත් ලොකු මුදලක් යන්නෙත් නෑ. පිටුවකට එකයි පනහක් වගේ තමයි මිල කරන්නේ. එතකොට පිටු දෙසීයක පොතක් රුපියල් තුන්සිය පනහක් විතර වෙනවා. සමහරු පිටුවක් රුපියල් දෙකටත් මිල කරනවා. මම නම් එහෙම කරන්නේ නෑ. එකයි පනහට මිල කළත් ඒකෙන් සීයට දහයක් කර්තෘ භාගය ගෙවලා සීයට දහයක් ප්‍රකාශකයටත් ගන්න පුළුවන්. ඒක ප්‍රමාණවත්. අනෙක පොතක් අතට ගන්න පාඨකයට හැඟීමක් එන්න ඕනේ මේ පොතේ මිළ සාදාරණයි කියලා.

**පොත් ප්‍රකාශනයෙන් ප්‍රකාශකයෝ හැදුනට 10% කර්තෘ භාගයට පොත් ලියලා ලේඛකයන්ට පැවැත්මක් නෑ කියලා කියනවා නේද?**

ප්‍රකාශකයෙක්ගේ යුතුකම වෙන්න ඕනේ ලේඛකයන්ට සලකන එක. මොකද කිසිම ප්‍රකාශකයකුට ලේඛකයන් හදන්න බෑ. ප්‍රකාශකයෝ හැදෙන්නේ ලේඛකයන් නිසා. අද මේ රටේ හැම ප්‍රකාශකයෙක්ම යන්නේ කාර්වල. ඒත් හැම ලේඛකයෙක්ම කාර්වල යන්නේ නෑ. නමුත් මම නම් නිතරම මගේ ලේඛකයන්ගේ දුක සැප බැලුවා. ඒකයි ඒගොල්ල මට ආදරේ. සමහරු සීයට දහයේ කර්තෘ භාගය මදි කියනවා. මම කියන්නේ සීයට දහය හරි හරියට දෙනවා නම් ඇති. වෙලා තියෙන්නේ ඒක හරියට නොගෙවන එකනේ. පොත් දෙදාහක් ගැහුවොත් හරියට ගනන් බලලා කර්තෘ භාගය ගෙවනවා නම් රුපියල් ලක්ෂයක් විතර ලැබෙනවා.

ලේඛකයෙකුට එක පොතකට රුපියල් ලක්ෂයක් ලැබෙනවා කියන්නේ ඒක සැළකිය යුතු ගානක්. නැවත මුද්‍රණය කරන වාරයක් වාරයක් පාසා මුදල් ලැබෙනවා. ඒ ලාබෙම තමයි ප්‍රකාශකයටත් තියෙන්නේ. ඒ නිසා මම හිතනවා ඒක සාදාරණයි කියලා.

**ඔබගේ පියා මරදානේ හිටිය ප්‍රමුඛ පෙළේ ගෘහ භාණ්ඩ ව්‍යාපාරිකයෙක්. ඔබ තෝරාගන්නේ පියාගේ ව්‍යාපාරික ක්ෂේත්‍රයට කිසිම සම්බන්ධයෙක් නැති ව්‍යපාරික ක්ෂේත්‍රයක්. පොත් ප්‍රකාශකයකු ලෙස ඔබ ඇරඹූ ගමනට පියාගෙන් මොනවගේ ප්‍රතිචාරයක්ද ලැබුණේ?**

පියාගෙන් මට මේ වැඩේට එහෙමට සහයෝගයක් ලැබුණේ නෑ. මගේ පවුලේ හැමෝම විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලැබුව අය. අයියයි අක්කලා දෙන්නයි තුන්දෙනාම. අපේ තාත්තටත් ඕනේකම තිබුණේ කොහොම හරි මට උගන්නන්න. මට විශ්වවිද්‍යාලේ යන්න බැරිවුණේ මේ පොත් ප්‍රකාශනයට යොමුවුණු නිසයි. මම උසස් පෙළ කළේ ජීව විද්‍යා අංශයෙන්. අපේ තාත්තට ඕනේ වුණේ මාව පිටරට ඇරලා හරි මාව දොස්තර කෙනෙක් කරන්න. තාත්තට සල්ලිත් තිබුණ නිසා මට කිව්වේ එංගලන්තෙට ගිහින් හරි ඉගෙන ගනින් කියලා. නමුත් මට ඒකට හිත ගියේ නෑ. මට ආශාව තිබුණෙම මේකට. මම උපන්නේ මේකටය කියන හැඟීමෙන් මම කටයුතු කළා. මට ලීබඩු වික්කනම් ඒ පැත්තෙනුත් ලොකු ව්‍යාපාරිකයෙක් වෙන්න තිබුණා. මට මතකයි ඒ කාලේ ලී බඩු සාප්පුවට බඩුවක් ගන්න කෙනෙක් ආවම අපේ තාත්ත මාවම තමයි දාන්නේ ඒ අයත් එක්ක කතා කරන්න. මම කතා කළාම දෙකක් නෑ ආව මනුස්සයා ලීබඩු ගන්නවාම තමයි. ඒ පින මට තිබුණා.

අදටත් ඒ ශක්තිය මට තියනවා. අද වෙනකම් කිසිම ලේඛකයෙක් මා එක්ක තරහා වෙලා අමනාප වෙලා ගිහිල්ලා නෑ. ඒ අයත් මට ආදරෙයි. මමත් ඒ අයට ආදරෙයි. අන්න එහෙම ශක්තියක් පොඩි කාලේ ඉඳලාම මට තිබුණා.

**අපි දන්න විදිහට නම් ඔබ පොත් ප්‍රකාශකයකු වශයෙන් ස්ථාවරත්වයක් ගොඩනගා ගන්නේ නිර්මාණාත්මක සාහිත්‍ය, විශේෂයෙන්ම නවකතා පොත් ප්‍රකාශනයෙන්. නමුත් අදවෙන-කොට ඔබ නවකතා පොත් ප්‍රකාශනයෙන් ඈත් වෙමින් බන කතා පොත් ප්‍රකාශනයට වඩා සමීප වෙමින් සිටිනවා.මේ වෙනස වෙළඳපොළ ඉල්ලුමට සැපයීමක්ද?**

නෑ. ඒක නෙවෙයි. හොඳ බෞද්ධයෙක් හැටියට මම විශ්වාස කරනවා මේ ලොකයේ තියන උතුම්ම දානය තමයි ධර්ම දානය. නවකතා පළකරනකොටත් මම බෞද්ධ නවකතා හුගාක් පළකරලා තියනවා. මගේ බිරිඳත් හුගාක් ලියන්නේ බෞද්ධ පොත පත. මගේ දෙමව්පියොත් බොහෙම පන්සල්වලට ලැදි අය. අපි බෞද්ධ පරිසරයක හැදිච්ච පවුලක් හැටියට මිනිස්සු අතරට ධර්මය ගෙන යන්න ඕනේ කියලා මම හිතුවා. අතිපූජ්‍ය කිරිබත්ගොඩ ඥානානන්ද ස්වාමින්වහන්සේගේ මුල්ම පොත 'ඒ අමා නිවන් සුව බොහෝ දුර නොවේ' කියන පොතේ පිටපත් ලක්ෂයක් මේ වෙනකොට මුද්‍රණය කරලා තියනවා. උන්වහන්සේගේ පොත් ලෝකය පුරා ඉන්න බෞද්ධයෝ ඉල්ලනවා. උන්වහන්සේගේ සියලුම පොත් පළකිරීමේ අවස්ථාව මට ලැබීම මගේ ප්‍රකාශන ජීවිතයේ මහත් භාග්‍යයක් කොට සළකනවා.

බෙල්ලන ඥානවිමල හාමුදුරුවන්ගේ පොතක් ගහලා ඒකෙන් ලැබුණ මුදලින් අපි දුප්පත් පවුල් දහයකට ගෙවල් දහයක් හදලා දුන්නා. ගංගොඩවිල සෝම ස්වාමීන්වහන්සේට පින් පිනිස මම හෘද රෝග ඒකකයේ බුදු මැදුරක් හැදුවා. ඉන්දියාවේ මහ බෝධි සමාගමේ වාහල්කඩ මම හැදුවා. චෛත්‍ය, බුදු පිළිම හුගාක් හදලා බෞද්ධ කටයුතු කරන්නත් ලොකු අවස්ථාවක් මට මේකෙන් ලැබුණා. ඉතිං මම මේකෙන් හුගාක් සතුටු වෙනවා. බෞද්ධ පොත්පත් අලෙවි කිරීමෙන් ලැබෙන ලාභය මම පෞද්ගලික ප්‍රයෝජනයට ගන්නේ නෑ. ඒවයින් කරන්නේ මේ වගේ ධාර්මික ධර්ම ප්‍රචාර වැඩකටයුතු තමයි. මගේ බිරිඳ දමයන්ති ජයකොඩි ලියන්නෙත් බෞද්ධ පොත්. 'අපේ බුදුහාමුදුරුවෝ', 'බුද්‍ද දහමයි මහ මුහුදයි' ඒ ආදී වශයෙන් බෞද්ධ පොත් ගණනාවක්ම ඇය ලිව්වා. ඒවත් බොහොම ජනප්‍රියයි.

අනෙක මම නවකතා පොත් වුණාත් අච්චු ගැහුවේ මුලින්ම මම කියවලා බලලා. මගේ දරුවන්ට කියවන්න සුදුසු පොතක්ද කියලා බලලා තමයි ඒ පොත අච්චු ගහලා අනෙක් දරුවන්ට දුන්නේ. කිසිම අසභ්‍ය පොතක් පළකරලා නෑ. මගේ පොත් සිය ගණනකට මේ වෙනකොට සම්මාන ලැබිලා තියනවා. පොත් තුන්දාහක් විතර මේ වෙනකොට පළකරලා තියනවා. ඒ හැම පොතක්ම බන පොත් වගේම හොඳ පොත්. දයාවංශ ජයකොඩි සහ සමාගම පළකරන්නෙ හොඳ පොතක් කියන හැඟීම අද පාඨක සිත්තුළ තියනවා. ඒක අවුරුදු පනහක් තිස්සේ මම අමාරුවෙන් ගොඩනගපු දෙයක්.

**නවකතාවකින් අද පිටපත් දාහක් විකුණගන්නෙත් බොහොම අමාරුවෙන් කියන කතාව බොහෝ විට ප්‍රකාශකයන් කියනවා. කෙටි කතා සහ කවි ගැන නම් කතා කරන්නවත් ඇතැම් ප්‍රකාශකයන් කැමති නෑ. නමුත් මෑතක ක්ෂේත්‍රයට ආ තරුණ ලේඛකයන්ගේ ඇතැම් නවකතා පිටපත් පනස්දාහ, හැටදාහ විකිණුන බව තව පැත්තකින් ඒ අය කියනවා. මේ කාරණය සම්බන්ධයෙන් ඔබේ අත්දැකීම් මොනවගේද?**

කෙටි කතා, කවි, නාට්‍ය වගේ පොත්, ගීත පොත් අලෙවිකරන එක අපහසුයි කියන කතාව ඇත්ත කතාවක්. කවි පොත් අරගෙන කියවනවාට වඩා අද හැම පත්තරේකම වගේ කවි පිටුවක් තියනවා. ඒවායින් පාඨකයෝ කවි කියවනවා. කෙටිකතාත් එහෙමයි. තරුණ ලේඛකයන්ගේ ඇතැම් නවකතා පොත් පිටපත් පනස්දාහ හැටදාහ විකිනෙනවා කියන එකත් ඇත්ත වෙන්න පුළුවන්. ඉස්සරත් එහෙම තිබුණා. කරුණාසේන ජයලත් මහත්තයාගේ 'ගොළු හදවත' පිටපත් ලක්ෂයක්වත් ගහලා ඇති. ඒවාට කැමති පාඨක පිරිසකුත් හැමදාම මේ රටේ ඉන්නවා. සමහරු බොළඳයි කියලා කියන එවැනි ප්‍රේමකතාත් තිබිය යුතුයි. මාරක කතා තිබිය යුතුයි. හැම අංශයෙන්ම මේක සර්ව සම්පූර්ණවෙලා තියෙන්න ඕනේ කියන එකයි මගේ විශ්වාසය.

**කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පැවැත්වෙන ජාත්‍යන්තර පොත් දැක්ම සාහිත්‍ය මාසයේදී සිදුවෙන තවත් සුවිශේෂී කටයුත්තක්. සාහිත්‍ය මාසය, කියැවීමේ මාසය, සාහිත්‍ය සම්මාන ප්‍රදාන උත්සව, ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශණ වගේ දේවලින් පොත් වෙළෙඳුන්ට යහපතක් වුණත් සාහිත්‍යයේ ගුණාත්මක වර්ධනයට ලැබෙන දායකත්වයක් නැති බව ඇතැම් අයගේ මතයයි. ඔබ මේ ගැන දරන්නේ මොනවගේ මතයක්ද?**

ඇත්ත වශයෙන්ම මෑත කාලීනව පාඨක සමාජයේ ප්‍රබෝධයක් ඇතිවුණේ කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශණයෙන්. බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ නොයෙකුත් ප්‍රදර්ශණ තියනවා. ඒත් මේ පොත් ප්‍රදර්ශණයට එන අය දිහා බැලුවම පේනවා ඒ තරම් සෙනගක් වෙන කිසිම ප්‍රදර්ශණයකට එන්නේ නෑ. අනෙක මේකට එන්නේ පොත් සාප්පුවලට සාමාන්‍යයෙන් එන පිරිසකුත් නෙවෙයි. අමුතුම පිරිස-ක්. විශාල වශයෙන් පොතුත් මිලදී ගන්නවා. මෙවර පොත් ප්‍රදර්ශණයේ ප්‍රධාන අනුග්‍රහයත් අපි ගත්තා. විශාල මුදලක් වැය කරලා ඒක ගත්තේ එහි ඇති වටිනාකම සළකලයි. පොත් අලෙවිය විතරක් නෙවෙයි මේකේ කෙරෙන්නේ. පාඨකයෝ ගෙන්නලා ලේඛකයෝ ගෙන්නලා සම්මන්ත්‍රණ තියනවා. සාකච්ඡා තියනවා. පොත් දොරට වඩින උත්සව තියනවා. විචාරක හමුවීම් තියනවා.

සම්මාන ගැන කියනවා නම් මේ රටේ විවිධ සම්මාන උත්සව තිබ්බට පාඨකයන්ගේ ඒ ගැන වැඩි විශ්වාසයක් තියන බවක් පේන්නේ නෑ. නමුත් ශ්‍රී ලංකා පොත් ප්‍රකාශකයන්ගේ සංගමය පවත්වන ස්වර්ණ පුස්ථක සම්මානයට ලොකු පිළිගැනීමක් තියනවා. ඒකෙදි අවසන් වටයට නිර්දේශවන පොත් පහ කිසිම ප්‍රශ්ණයක් නැතිව පිටපත් පන්දාහ ගානේ විකුණන්න පුළුවන්. ප්‍රථම ස්ථානය දිනාගන්න පොත පිටපත් දහදාහක් විකුණන්න පුළුවන්. ඒ කියන්නේ පාඨකයෝ විශ්වාස කරනවා.

**ලේඛකයා සහ පාඨකයා යා කෙරෙන පාළම ප්‍රකාශකයා. එහිදී ප්‍රකාශකයකුගේ කාර්යභාරය කිසි-සේත් අවතක්සේරු කළ නොහැකියි. එහෙත් බොහෝ ප්‍රකාශකයන් නිරන්තරයෙන්ම ලේඛකයන්ගේ විවේච-නයට ලක්වෙනවා. ප්‍රමාණවත් මුදලක් කර්තෘ භාගය ලෙස නොගෙවීම, කර්තෘ ප්‍රකාශකයන්ට නොපමාව මුදල් නොගෙවීම ප්‍රකාශකයන්ට නිතර එල්ල වෙන චෝදනා. මේ කාරණා ඔබට අදාළ නොවෙනවා වෙන්න පුළුවන් නමුත් ප්‍රකාශකයකු ලෙස ඔබ දකින්ෙ-න් මොන විදිහටද?**

ඔය වගේ චෝදනා නම් නිතරම ඇතිවෙනවා. නමුත් එහෙම නොවෙන්න ප්‍රකාශකයන්ට ක්‍රියාකරන්න පුළුවන්. මොකද ප්‍රකාශකයන්ට සල්ලි තියනවානේ. මම නම් හුඟාක් වෙලාවට පොත් ගහලා ගෙනාපුවම ඒවෙලාවෙම සල්ලිදීලා පොත් පහළොවක්වත් අරගන්නවා. ඉතිං ඒ මනුෂ්‍යයා ආශිර්වාද කරලා යනවා. ලේඛකයෙක්ගේ පොතක් ගැහුවම මම කර්තෘ භාගය එක පාර දෙනවා. රුපියල් තුන්සීයක් මිල වෙන පොත් දාහක් මුද්‍රණය කරනවා කියලා හිතමු. කර්තෘ භාගය තිස්දාහයි. ඒ මුදල අපි කොයිවෙලේ හරි දෙන්න ඕනේනේ. ඒක එකපාර දුන්නොත් එයා කොච්චර සතුටකින් යනවද? අන්න ඒ ආශිර්වාදය තමයි මට ලැබුණේ. මට එහෙම ගෙවන්න පුළුවන් වුණාට අනෙක් හැම ප්‍රකාශකයෙකුටම එහෙම කරන්න

16 වන පිටට

*මේ ළඟදී අපනයන සංවර්ධන මණ්ඩලයෙන් කතා කරලා කියනවා ඔබතුමාගේ සේවය බොහොම අගය කරනවා. අපි ඉල්ලුම් පත්‍රයක් එවනවා ඒක පුරවලා එවන්න සම්මානයක් දෙන්න කියලා. තමන්ට සම්මානයක් දෙන්න කියලා ඉල්ලලා අස්සන් කරලා ෆෝම් එකක් එවන්නලු. මොන ලැජ්ජ නැති වැඩක්ද ඒක. මම කිව්වා මට නම් ඒක කරන්න බෑ. නමුත් ඔබතුමාලට මගේ සේවය හොඳයි කියලා හිතිලා සම්මානයක් දෙනවා නම් ඒක ඔබතුමාලගේ වැඩක්. මම ඒක නොසලකා හරින්නේ නෑ කියලා.*

## නොන්චි කෝලම මෙල්බර්න් හිදී



ස්කැටිස් සංවිධානයේ 20 වන සංවත්සර උත්සවය වෙනුවෙන් පැවති විවිධ ප්‍රසංගයේදී රඟ දක්වන ලද නොන්චි කෝලම විශේෂාංගයේ ජවනිකා කීපයකි මේ. දයාන් රණසිංහ නොන්චි ලෙසත් මාලන් සුරවීර පණික්කලේ ලෙසත් සඳමාල් වර්ණකුලසූරිය සහ බිමල් ප්‍රනාන්දු ගැමි ලියන් ලෙසත් සිය රංගනයෙන් මේ විශේෂාංගය ඔපවත් කළ හ

සේයා රූ බිමල් ප්‍රනාන්දු